නිරාශා දැඩි තීරණයකට එළැඹ සිටින්නීය. ඇයට මේ දේ පැහැදිලි කරන්නට යාම තේරුමක් ඇති වැඩක් නොවේ. නිහඬව බලා සිටීම මැනැවැයි විදුල තීරණය කළේ එනිසා ය.

මේ සිදුවන්නේ සිදුවන්නට නියමිතව තිබූ දෙයකි. නිරාශා යම් දිනෙක සිය ස්වයංවාරණයෙන් මිදෙන බව විදුල නොදැන සිටියා නොවේ. නොදැන සිටියේ එය සිදුවන්නට ඇවැසි පසුබිම කුමක්ද යන්න සහ එය සිදුවන දිනය පමණකි. සියලු වාස්තවික තත්ව මේ සා පහසුවෙන් සහ මේ සා ඉක්මණින් උදා වේ යයි සිතන්නට තරම් කරුණු කාරණා ඔහු නොදැන සිටියේ ය. අඟහිඟ කම් පිළිබඳව හෝ සිය ක්ෂෙත්‍රයෙන් බැහැරව හුදකලා වීම පිළිබඳව හෝ කිසිවිටෙක මැසිවිලි නොනැගුවද ඇය යම් මානසික පීඩනයක සිටින්නට ඇතැයි යන්න ඔහුට දැනෙන්නේ දැන් ය. තමාගේ ලෝකය තුළ ඇය සතුටින් සිටින්නේය යන මිථ්‍යාව තමා මේ තරම් කාලයක් විශ්වාස කළේ මන්දැයි ඔහු කල්පනා කළේ ය.

කාලාන්තරයක් නිසළව තිබූ වැව් දිය, බැම් සිඳී ගිය දා මහා ප්‍රවාහයක්ව ගලා යන්නේ කිසිවකුට පාලනය කළ නොහැකි සේ ය. බලා සිටීම බුද්ධිගෝචර දෙයකි.

සාලයේ බිත්තියේ සවි කළ දිග රාක්කයේ තමා වරින් වර දිනාගත් සම්මාන පෙළට සිටුවා ඇති ආකාරය විදුලට පෙනෙයි. මේ එක එක සම්මානය ප්‍රදානය කෙරෙන විට කියැවුණ බරසාර වදනින් ලියැවුණ හේතු පාඨ බොහොමයක් ඔහුට අමතකය. අවසන් සම්මාන අළෙලේදී කියැවුණ හේතු පාඨය යාන්තමින් සිහිපත් කරගන්නට ඔහු උත්සාහ කළේ ය.

"සමාජ ආර්ථික හා දේශපාලන ප්‍රවාහ ඉදිරියේ නොසැළෙණ මිනිසත්කම නිර්ව්‍යාජ ලෙස සිනමාවට නංවා හෙළ සිනමාව ලෝක සිතියමේ නිශ්චිත තලයක ස්ථානගත කිරීමේ උත්තම ක්‍රියාව උදෙසා මේ සම්මානය පිදෙයි...."

යමින් සිටියේ දිග ගමනක්ය යන්න සැබෑවකි. යමින් සිටි ගමන අතරමග නවතින්නේ නම් මේ සියල්ල විහිලුවක් පමණකි. ගං ඉවුරේ නැවතී නොසිට ගඟ තරණය කරන්නට ක්‍රමයක් සොයාගත යුතුය. ඒ යාත්‍රාව ලීයෙන් යකඩින් සෑදුවද රනින් සෑදුවද කම් නැතැයි විදුලට සිතුණි. ගඟ තරණය කළ යුතුය. කෙසේ හෝ ගඟ තරණය කළ යුතුය. ඒ වෙනුවෙන් දරන්නට වන අධික මිල සාධාරණීකරණය කරන්නට ඔහුගේ සිත පෙළැඹෙමින් තිබුණි.

විදුල යාන්ත්‍රිකව ඇඳ පැළඳ ගත්තේ ය. ඔහු යම් තීරණයකට එළැඹ සිටියේ ය. සියල්ලෝම දිය පහරේ ගසා යද්දී තමා පමණක් කෙලෙස නම් මේ ලෙසින් උඩු ගං බලා පිහිනන්න දැයි විදුලට නොවැටහෙයි. මේ සියල්ලේ අවසානයක් තිබිය යුතුය.

සමදරා හමුවීමට යා යුතු ය. වාහනයට ගොඩ වූ ඔහු කල්පනාවෙන් බර වූ සිතින් එය පාරට ගත්තේ ය.

"සමාජයක් වෙනස් කරන්න සර් වගේ එක්කෙනෙකුට දෙන්නෙකුට විතරක් කරන්න පුලුවන් දෙයක් නෙවෙයිනෙ.." මදාරා දිනෙක කියූ වදන් විදුලට සිහිපත් විය. එය සැබෑවකි. එනමුදු මේ ගමන යා යුතුමය. ඒ සඳහා පියවරක් දෙකක් පස්සට ගන්නට සිදුවනු ඇත. එය උපක්‍රමයක් යයි සිතා සිත හදා ගන්නට විදුල උත්සාහ ගත්තේ ය. උපක්‍රමශීලී වීම වරදක් නොවේ. උපක්‍රමශීලී නොවී මේ ගමන යා නොහැකිය. ඔහු සිතින් තර්ක කළේ ය.

සමදරා ගේ කාර්යාලයට එන අතරතුර දී නිරාශා දුන් චෙක් පත ඇගේ බැංකු ගිණුමේ තැන්පත් කරන්නට ඔහු අමතක නොකළේ ය. මේ ඇගේ මුදල් ය. ඒවා අයිති ඇයට ය.

0000000000000

තමා ඉදිරියේ වාඩි වී සිටිනා විදුලගේ මුහුණේ ඇඳී ඇති පරාජිත ස්වරූපය සමදරාගේ සිතේ ඇති කළේ කණගාටුවකි. විසල් සටනකින් පරාජය වූ සෙන්පතියා දැකීමෙන් සතුටු විය නොහැකි ය.

ඔහුගේ ඒ පරාජය තමාගේ අරමුණ ඉෂ්ඨ කරනු ඇති නමුත් ඔහු මෙලෙසින් ඇද වැටීම ඇගේ සිතේ ඇති කළේ කම්පනයකි. වදනක් දොඩා ගත නොහැකිව විනාඩි කීපයක් කල්පනා කරමින් සිටියේ එනිසා ය.

"උඹ හොඳට හිතලද මේ තීරණේ ගත්තෙ ..?" සමදරා අවසන නිහඬතාව බිඳිමින් ඇසුවා ය. ඇගේ කටහඬ අසාමාන්‍ය ලෙස බිඳ වැටී තිබුණි. ජයග්‍රහණයේ උද්දාමය පිළිබඳ අංශු මාත්‍රයක හෝ සේයාවක් ඒ කටහඬෙහි ගැබ්වී නොතිබුණ බව සහතික ය.

"මට වෙන ඔප්ෂන් එකක් නැහැ සාමා.." විදුල පහත් හඬින් කීවේය. ".. මට කොහොම හරි මගේ ෆිල්ම් එක හදන්න ඕනෙ.. ඒකට අවශ්‍ය මුදල මං කොහොම හරි හොයා ගන්න ඕනෙ.. මගේ වැඩේ කෙරෙනවා නම් මං ඇමතිතුමාගෙ වැඩේ කරන්නං.."

"මට තේරෙනවා.." සමදරා කීවා ය. ලිපිගොණු කීපයක් ගෙනැවිත් මේසය මත තැබූ කාර්යාල කාර්ය සහායකයා ඉවත්ව යන තෙක් ඈ මොහොතක් කතාව නවතා බලා සිටියා ය. "..ඒත් මං උඹට කියන්නෙ ආයෙම නිවී සැනසිල්ලෙ මේ තීරණය ගැන කල්පනා කරන්න කියලයි.. මේකෙ රිපකෂන්ස් මොනාද කියලත් උඹ දන්නවනෙ?"

සමදරාගේ කාර්යාල කාමරයේ වීදුරු ජනේලයෙන් ඔබ්බේ පෙනෙන කෘතිම වන වගාව දෙස විදුල බොහෝ වේලාවක් බලා සිටියේ අරමුණකින් තොරවය. සිත අකර්මන්‍යව ඇති සෙයක් ඔහුට දැනෙයි. තමාගේ මේ තීරණය තමාගේ ප්‍රතිරූපය මුලු මහත් සමාජය ඉදිරියේ බිඳ දමනු ඇති බව නිසැක ය. සමස්ථ මාධ්‍ය ලෝකයම තමා උපහාසයට ලක් කරනු ඇති බවද ඔහු දනියි. ඒ සත්‍යය කටුකය. එහෙත් නිර්මාණය කෙරෙහි බැඳුණ දරදඬු සිත ඒ සියල්ල විඳ දරා ගන්නට සූදානම් බව කියයි. එයට ඉඩ දිය යුතු ය.







"මගේ ෆිල්ම් එකට සල්ලි හොයා ගන්න මට වෙන ක්‍රමයක් නැහැ සාමා..." ඔහු මිමිණුවේ ය.

විදුල දෙස බොහෝ වේලාවක් බලා සිටි සමදරා සුසුමක් හෙලුවාය. තමා ඉදිරියේ වූ ලිපි ගොණු කීපය පසෙකට කළ ඈ මේසය කෙළවරක වූ දුරකතනය තමා වෙතට ඇදගත්තා ය.

"හරි.. උඹ කෙලින් තීරණයකට ආවා නම් මං ඒ ගැන සතුටුයි.. මං පොරොන්දු වෙන්නං කොහොම හරි උඹේ වැඩේ කෙරෙන තැනට ඇමතියව ගේන්න.. මාව විශ්වාස කරපං.. අපි කොහොම හරි උඹේ ෆිල්ම් එක කරමු.." සමදරා දුරකතන රිසීවරය අතට ගන්නා අතර කීවාය. ඇය ඇමතිවරයාගේ දුරකතන අංකය ඔබනු විදුල බලා සිටියේ හැඟීම් විරහිතව ය.

**මතු සම්බන්ධයි**




## Humans Vs. Animals

**Humans may be the best**
**But when put to the test**
**The ants will build a better team**
**But through brains will the humans redeem**
**While the dog has learned every trick**
**And understand when a human is sick**
**While the spider creates a web to catch its prey**
**Very still will the other bus stay**
**To survive in the wild you need to be smart**
**And that is why the humans are at the start**

Humans and animals are often compared with each other, like when someone is being silly they are usually compared to a monkey. Both humans and animals have a lot in common, whether it is the way we act or how we think. Humans are thought to be one of the most diverse species Although we may be similar humans and animals can contain different traits. While most human traits that are better than those of animals there are some things that the mankind can learn from wild creatures. Humans are thought to be one of the most diverse species but if you look at the wildlife you can see amazing things happening on a day to day basis.

Ants are hardworking creatures that spend the whole day foraging. They do not just go out looking for food to feed themselves; they go out to look for food to feed their whole colony no matter how big it is. One piece of bread is enough for one ant to eat, but that one ant doesn't just eat the bread but instead take it back to the home to share it with everyone. Ants are teams they always work together, whether it is helping their team mates to carry something or bringing food back to the rest of the colony that were unable to go foraging. Not only ants are hardworking animals that work in teams but bees are too. They are able to work in different roles in the beehive so that every bee has job to help the hive grow.

If humans could work as nicely as the ants do then maybe we could become stronger and not have as much problems as there are now in the world. Humans always put themselves first and most people are unable to work in teams because they want to be superior and want to have all the power to themselves, humans only think about how they get affected individually. When someone dies you see lots of people grieving and mourning for them. In actual fact the main reason these people are crying is because what the person gave to them when that person was living cannot be given to them anymore.

At the same time humans are also one of the smartest species in the world. Just by looking around, you can see how well established mankind is. Spiders are also very intelligent animals; you see them making these webs that are kind of like the buildings that humans make. They use their own home as a very effective way to catch their prey, it's kind of similar to how we humans have kitchens in our houses to cook food. Humans communicate with each other in a way that has been seen by other species, but the Bottle Nose Dolphin has a special "vocabulary" that helps understand simple human gestures. Like when you go to the aquarium and see the dolphin shows and you always think about how smart they must be to be able to understand what is going on. Dogs are also very smart animals because of the way they can understand simple signals by humans and respond to their given name.

There are many species of animals that also have special trades like humans do. For example parrots who have a very extensive memory, while the dog has a keen sense of smell and hearing (that is why they are used in airports to smell out drugs) and Octopuses that re very intelligent and are able to solve difficult problems. The Ape is the closest related animal to the human, they act like us and live in families like us but they don't have the ability to comprehend things like the human can. Although lots of animals possess amazing talents, their talents are a small portion compared to what the human can do. We are able to realise what is happening and figure out the reality. Mankind have the gift to be able to grow both spiritually and as a person. When you are a human you have your moral which you live by, we have the ability to process the reality and that is one of the most important things you need to survive on earth.

Humans and animals have many similar traits in the way in which we live. Some animals may even be nearly as smart as humans. One thing that humans struggle with the most is working in teams, this skill some animals have mastered and use to their benefit every day. Although may still be the number one species above the rest, there are still things that we can learn from animals both small and big.